# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1842/16 - 2013 දෙසැම්බර් මස 27 වැනි සිකුරාදා - 2013.12.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1972 අංක 10 දරන නැව් නියෝජිතයින්ට, නැව් බඩු ගෙන යන්නන්ට යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනත**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු 1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනතේ 10 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලද නියෝග.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2013 දෙසැම්බර් මස 26 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2013 නැව් නියෝජිතයින්ගේ, නැව් බඩු ගෙනයන්නන්ගේ, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ගේ සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ගේ නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර එකී නියෝග 2014 ජනවාරි මස 06 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

2. (1) නැව් නියෝජිතයකුගේ, නැව් බඩු ගෙනයන්නකුගේ, යාත්‍රා ක්‍රියාකරුවකු නොවන පොදු ප්‍රවාහකයකුගේ, කන්ටේනර් මෙහෙයුම්කරුවකුගේ හෝ නැව් බඩු ඒකාබද්ධකරුවකුගේ ව්‍යාපාරය පවත්වාගෙන යන (මෙහි මින්මතු "බලපත්‍රලාභී සේවා සපයන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) සෑම බලපත්‍රලාභී නැව් නියෝජිතයකු, නැව් බඩු ගෙනයන්නකු, යාත්‍රා ක්‍රියාකරුවකු නොවන පොදු ප්‍රවාහකයකු සහ කන්ටේනර් මෙහෙයුම්කරුවකු විසින්ම නැව් බඩු තොගය "ප්‍රවාහක ගාස්තු පෙර ගෙවන ලද නැව් බඩු " හෝ "ප්‍රවාහක ගාස්තු ගෙවිය යුතු නැව් බඩු " වශයෙන් නිශ්චිතව දැක්වෙන පිරිසිදු නැව්භාර පතක් නිකුත් කළ යුතු ය.

(2) කිසිම නැව් භාරපතක නැව් බඩු තොගය "ප්‍රවාහක ගාස්තු ශූන්‍ය නැව් බඩු " වශයෙන් සඳහන් නොකළ යුතු ය.

1A - PG 1897 — 610 (2013/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. (1) බහලුම්වල ඇති නැව් බඩු ප්‍රවාහන ලේඛනයේ දක්වා ඇති ආරම්භක ස්ථානයේ සිට ගමනාන්තය දක්වා ගෙනයාමට අයකරනු ලබන සියලුම ගාස්තු, නැව්භාර පතේ නිශ්චිතව දක්වා ඇති සියලු ගාස්තු සහිත ප්‍රවාහක ගාස්තුවට ඇතුළත් කරනු ලැබිය යුතු ය. තවද, එම ගාස්තු ගිවිසුම මගින් ගෙවීමට බැඳෙන පාර්ශවයෙන් පමණක් අයකරනු ලැබිය යුතු ය.

(2) (1) වන උප වගන්තියේ සඳහන් "සියලු ගාස්තු සහිත ප්‍රවාහක ගාස්තුවට" පහත දැක්වෙන ගාස්තු ඇතුළත් විය යුතු ය :-

(අ) සම්පූර්ණ බහලුමක් මත වූ ගාස්තු ;
(ආ) පර්යන්ත මෙහෙයුම් ගාස්තු ;
(ඇ) නැව්භාර පත නිකුත් කිරීම සඳහා ගාස්තු හෝ ප්‍රවාහන භාණ්ඩ භාරගැනීමේ ලදුපත නිකුත් කිරීම සඳහා ගාස්තු ;
(ඈ) අසම්පූර්ණ බහලුම් භාණ්ඩ සඳහා ගාස්තු (අදාළ වන්නේ නම්).

(3) මෙම නියෝගවල කාර්ය සඳහා බහලුම් ගත නැව් බඩු ප්‍රවාහනයට අදාළව "ආරම්භයේ සිට ගමනාන්තය දක්වා" යන වචනවලින් මෙම නියෝගවල කාර්ය සඳහා-

(අ) බහලුම් අංගනයක සිට බහලුම් අංගනයකට භාණ්ඩ ප්‍රවාහනය කිරීම ;
(ආ) බහලුම් නිශ්කාෂන මධ්‍යස්ථානයක සිට බහලුම් නිශ්කාෂන මධ්‍යස්ථානයකට භාණ්ඩ රැගෙන යාම ;
(ඇ) බහලුම් අංගනයක සිට බහලුම් නිශ්කාෂන මධ්‍යස්ථානයකට භාණ්ඩ රැගෙන යාම ; හෝ
(ඈ) බහලුම් නිශ්කාෂන මධ්‍යස්ථානයක සිට බහලුම් අංගනයකට භාණ්ඩ රැගෙන යාම,

අදහස් වේ.

4. නැව්භාර පතෙහි නිශ්චිතව දක්වා ඇති ආරම්භක ස්ථානයේ සිට ගමනාන්තය දක්වා භාණ්ඩ රැගෙන යාම සඳහා ආනයනකරුවකු විසින් 3(1) නියෝගයට යටත්ව, ගිවිසුමක් මත ගෙවීමට බැඳී සිටින සියළු ගාස්තු ඇතුළත් ප්‍රවාහක ගාස්තුව හැර, වෙනත් කිසිදු ගාස්තුවක් බලපත්‍රලාභී සේවා සපයන්නකු විසින් ශ්‍රී ලංකාවේ ආනයනකරුවකුගෙන් අයකරනු නොලැබිය යුතු ය :

එසේ වුව ද, යම් බලපත්‍රලාභී සේවා සපයන්නකු විසින් ආනයනකරුගෙන් ශ්‍රී ලාංකික රුපියල්වලින් ගෙවනු ලැබිය යුතු ආනයනික භාණ්ඩ භාරදීමේ ගාස්තුවක් අයකරනු ලැබිය හැකිය.

5. (1) බලපත්‍රලාභී සේවා සපයන්නකු විසින් ආනයනික භාණ්ඩ භාරදීමේ ගාස්තුවක් එසේ අයකරනු ලබන අවස්ථාවක, එකී සේවා සපයන්නා විසින් අය කරනු ලබන ගාස්තුව තත්කාලයේ දී අයකරනු ලබන ආනයනික භාණ්ඩ භාරදීමේ ගාස්තුවේ ප්‍රමාණය (මෙහි මින් මතු "අධ්‍යක්ෂවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙළඳ නැව් අධ්‍යක්ෂවරයා වෙත ගොනු කරනු ලැබිය යුතු ය.

(2) යම් බලපත්‍රලාභී සේවා සපයන්නකු ආනයනික භාණ්ඩ භාරදීමේ ගාස්තුවේ ප්‍රමාණය වැඩි කිරීමට අදහස් කරන්නේ නම්, තත්කාර්ය සඳහා වූ ඉල්ලීමක් සහ එම වැඩි කිරීම ලේඛනගත සාක්ෂි සමග අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) අධ්‍යක්ෂවරයා විසින් නිසි පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසුව -

(අ) එම සනාථ කිරීමේ ලේඛන පරීක්ෂා කිරීමෙන් පසුව යෝජිත ආනයනික භාණ්ඩ භාරදීමේ ගාස්තුවේ වැඩිකිරීම පිළිගනු ලැබිය හැකිය ; හෝ
(ආ) ආනයනික භාණ්ඩ භාරදීමේ ගාස්තුවේ යෝජිත ප්‍රතිශෝධනය ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය ; හෝ
(ඇ) අධ්‍යක්ෂවරයා විසින් සාධාරණ යයි සලකනු ලබන ආනයනික භාණ්ඩ භාරදීමේ ගාස්තුවේ විකල්ප වැඩි කිරීමක් යෝජනා කළ හැකිය.

(4) අධ්‍යක්ෂවරයාගේ තීරණය (2) වන ඡේදයේ සඳහන් ඉල්ලීම ලැබීමේ දින සිට වැඩකරන දින හතලිස් පහක් (45) ඇතුළත, ඒ තීරණය සඳහා හේතු ද දක්වමින් අදාළ බලපත්‍රලාභී සේවා සපයන්නා වෙත දැනුම් දිය යුතු අතර, එම තීරණය බලපත්‍රලාභී සේවා සපයන්නා මත අනුගම්‍ය වන්නේ ය.

6. නැව් භාර පතෙහි හෝ ප්‍රවාහන භාණ්ඩ භාරගැනීමේ ලදු පතෙහි නිශ්චිතව දක්වා ඇති ආරම්භක ස්ථානයේ සිට ගමනාන්තය දක්වා වූ භාණ්ඩ රැගෙන යාම සඳහා වූද 3(1) වන නියෝගයේ සඳහන් කර ඇති වූ ගාස්තුව හැර, වෙනත් කිසිදු ගාස්තුවක් කිසිම බලපත්‍රලාභී සේවා සපයන්නකු විසින් ශ්‍රී ලංකාවේ අපනයනකරුවන්ගෙන් අයකරනු නොලැබිය යුතු ය.

7. (1) මේ නියෝගවල සඳහන් බහලුම්ගත නැව් බඩු මත වූ ගාස්තු ව්‍යූහයට පටහැනි වන සහ මේ නියෝග ක්‍රියාත්මක වීමේ දිනට පෙරාතුව එළඹෙන ලද ගිවිසුමක වූ දැනට වලංගුව පවතින බැඳීමකට අනුව, බලපත්‍රලාභී සේවා සපයන්නකු විසින් අයකරනු ලබන ගාස්තු එකී ගිවිසුම අවසන් වන දිනය හෝ 2014 අප්‍රේල් මස 30 වැනි දිනය යන දින දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා දිගටම ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(2) (1) වැනි ඡේදයේ දක්වා ඇති පරිදි යම් ව්‍යූහගත ගාස්තුවක් අය කිරීමට අදහස් කරන බලපත්‍රලාභී සේවා සපයන්නකු විසින් මෙම නියෝගයේ දින සිට සති දෙකක් (02) ඇතුළත එකී ගිවිසුමේ පිටපතක් අධ්‍යක්ෂවරයා වෙත ගොනු කරනු ලැබිය යුතු ය.

(3) 3 වැනි නියෝගයේ සඳහන් බහලුම්ගත නැව් බඩු මත අය කරනු ලබන ගාස්තුවලට පටහැනි ගාස්තු ව්‍යූහයක් ඇතුළත් වන 2014 අප්‍රේල් මස 30 වැනි දිනට එපිටව ක්‍රියාත්මකව වන යම් ගිවිසුමක් මෙම නියෝගවලට අනුකූලවන පරිදි ප්‍රතිශෝධනය කිරීමට වග බලා ගත යුතු ය.

(4) එසේ ප්‍රතිශෝධනය කරනු නොලැබූ යම් ගිවිසුමක් වෙතොත් එය 2014 අප්‍රේල් මස 30 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මෙම නියෝගවලට අදාළ වන තාක්දුරට ශූන්‍ය සහ බලරහිත ලෙස සැලකේ.

01-494

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.